**<u>පුණරීක්ෂණය</u>**

පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(01) (1) ඔබ ප්‍රදේශයේ ජනතාව අවශ්‍යතා ඉටු කර ගැනීමට පිහිටුවා ගත් සමිති දෙකක් නම් කරන්න.

(2) සාමූහිකව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

(3) ඔබේ පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු දැනගත හැකි මූලාශ්‍ර දෙකක් ලියන්න.

(4) සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා සිදු කළ සේවාවන් දෙකක් ලියන්න.

(5) ශ්‍රී ලංකාව පිළිබඳ වාක්‍ය දෙකක් ලියන්න.

(6) ශ්‍රී ලංකාවේ පළාත් ගණන හා පරිපාලන දිස්ත්‍රික්ක ගණන පිළිවෙළින් ලියන්න.

(7) හිරු එළියෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

(8) ආගමික සිද්ධස්ථානයකින් සිදුවන සේවා දෙකක් ලියන්න. (ලකුණු 2 x 8 = 16)

(02) (1) ඔබේ පාසලේ අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත දෙකක් ලියන්න. (ලකුණු 2)

(2) පාසල් පරිසරය තුළ ඔබේ අධ්‍යාපන කටයුතුවලට සහයෝගය ලබාදෙන හතර දෙනෙක් නම් කරන්න. (ලකුණු 4)

(3) පාසල් සිසුවකු ලෙස ඔබගෙන් පාසලට ඉටුවිය යුතු යුතුකම් තුනක් සඳහන් කර, එසේ යුතුකම් ඉටු කිරීම නිසා පාසලට සිදුවන සේවය පිළිබඳ කරුණු දෙකක් ලියන්න. (ලකුණු 5)

(03) (1) ඔබ ජීවත්වන පළාතට ආසන්න පළාත් දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(2) ඔබ ජීවත්වන ප්‍රදේශයේ දක්නට ලැබෙන ස්වාභාවික සම්පත් හතරක් නම් කරන්න. (ලකුණු 4)

(3) ඔබ ප්‍රදේශයේ වෘක්ෂලතා වර්ග තුනක් නම් කර එම ශාකවල දක්නට ලැබෙන විශේෂිත ලක්ෂණ දෙකක් ලියන්න.

(ලකුණු 5)